
## ගොවි නෙතට කඳුළු ගෙනෙන ළූණු බීජ

# රත්ගිරි දඹුල්ලේ සිට...

මේ දඹුල්ල ප්‍රදේශයේ ළූණු අස්වනු නෙලන කාලයයි. ළූණු අස්වැන්න කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ හැකි ළූණු බීජ හා බැඳුනු ප්‍රශ්ණ කවරේදැයි සොයා බැලීමට අපි පසුගියදා දඹුල්ල, පැල්වෙහෙර, ඉනාමළුව, කණ්ඩලම, කිඹිස්ස සීගිරිය හා සියඹලාහේන වැනි ප්‍රදේශ වල සංචාරය කළෙමු .

දඹුල්ල ප්‍රදේශයේ ගොවීන් ලොකුළූණු බීජ මිලට ගනු ලබන්නේ පෞද්ගලික වෙළඳුන්ගෙනි. මෙම බීජ කිලෝ ග්‍රෑම් එකක් රු 300 සිට රු . 1200 අතර මුදලකට ලබාගත හැකිය. මෙම බීජ ලංකාවට ආනයනය කරනු ලබන්නේ ඉන්දියාවෙන් වන අතර එහි බීජ කිලෝ එකක මිළ ඉන්දියානු රුපියල් 35 ත් 90 ත් අතර ගණනකි



"රජය අත දෙනවානම් රටට අවශ්‍ය ළූණු බීජ සැපයීමට අපි සූදනම්"
- සියඹලා හේනේ ඥානසේන ගොවිමහතා (ලොකු ළූණු රජා)

ලංකාවේ ගොවින් අතර වඩාත්ම ජනප්‍රිය "රාම්පූර් " නැමැති බීජ ප්‍රභේදයයි. මේ ගැන අපි පැල්වෙහෙර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් ( බීජ සහ රෝපණ ද්‍රව්‍ය ) විමසූ විට , ඔහු මෙසේ පැවසීය . " මම දන්නා තරමින් " රාම්පූර් " නැමැති බීජ ප්‍රභේදයක් ඉන්දියාවේ නෑ . සමහර විට රාම්පූර් ප්‍රදේශයෙන් මිළට ගන්නා නිසා ඒවා ඒ නමින් හඳුන්වනවා වෙන්න පුළුවන්. මේ බීජ ලංකාවට ආනයනය කරන්නේ පෞද්ගලික වෙළෙන්දන්. ඔවුන්, ගුවන් මගින් මළුවල අසුරා ලංකාවට ගෙනෙන බීජ " සූට්කේස් බීජ " ලෙසත්, බත්තල් මගින් ඉන්දියාවේ සිට දිවයිනේ හලාවතට හෝ මන්නාරමට ගෙනෙන බීජ "බෝට්ටු බීජ " ලෙසටත් හැඳින්වෙනවා.

පෞද්ගලික වෙළඳුන් අලෙවි කරණ ඇතැම් බීජ හොඳ තත්ත්වයේ පැවතියත් බොහෝ වේලාවට නිසි ප්‍රමිතියකින් තොර බීජ වීම නිසා ගොවීනට නොයෙකුත් කම්කටොළු වලට මුහුණ දීමට සිදු වෙලා තියෙනවා . මේ අතරින් ප්‍රධාන වන්නේ බීජ වල ප්‍රරෝහණ හැකියාව (GERMINATION) අඩුවීමයි . මේ නිසා ළූණු වගාව සඳහා ගොවීන්ට වැඩි බීජ ප්‍රමාණයක් භාවිතා කරන්නට සිදු වෙනවා .

මේ සම්බන්ධව එක් ගොවි මහතෙක් මෙසේ ප්‍රකාශ කළේ ය. "බීජ කිලෝ ග්‍රෑම් දෙකක් දෙකහමාරක් පමණ අක්කරයක් සඳහා තවාන් පැල හදා ගැනීමට සෑහුනත්, මේ වතාවේ ඒ සඳහා බීජ කිලෝ ග්‍රෑම් 31 / 2 ක් අවශ්‍ය වුනා . මෙයට මූලික හේතුව පසුගිය වසරේ අලෙවි කර ගැනීමට නො හැකිව ඉතිරිවූ බීජ හොඳ බීජ, හා කලවම් කොට වෙළඳ පොළට ඉදිරිපත් කිරීමයි . සමහර බීජ ප්‍රරෝහණය වුනත් නිරෝගී ප්‍රරෝහක ලබා දෙන්නෙ නෑ . එවන් ශාඛ වලින් හොඳ ළූණු බල්බ ලබා ගන්න අමාරුයි."

මිලට ගත් ළූණු බීජ සමග කැරට් , සූදුරු සහ වෙනත් පැලෑටි වල බීජ කලවම් ව තිබූ බව ද ඇතැම් ගොවීහු චෝදනා කළහ. තව ද, අලෙවි කරන බීජ ළූණු ප්‍රභේද කිපයක මිශ්‍රණයක් වීම, නිසා දිගටි හැඩයේ ළූණු බල්බ , බහු බල්බ (ගොවීන් මෙයට කියන්නේ ඩබල් අල කියායි.) , සුදු බල්බ (ඇන්තොසයනින් වර්ණකය නැත්පත් නොවූ), මෝටාර් ඇති වීම සහ ඇතැම් විට කිසිසේත්ම බල්බ ඇති නොවීම නිසා ලීක්ස් ගස් වැනි ශාඛ ඇති වීම මෙහි වූ ප්‍රතිඵල වලින් සමහරකි . මේ සෑම හේතුවක් ම ළූණු අලෙවියේ දි විවිධ අයුරින් බලපාන බව සඳහන් කළ හැකි ය. සාමාන්‍යයෙන් ම සෑම බල්බ වර්ගයක් ම අලෙවියේ දී බාර ගනු නො ලබයි . ඒ නිසා අපහසුතාවයන්ට පත් වන්නේ ගොවීන් ය .


මෝටාර් අල බැසීම යනු නිසි අයුරින් නො සැකසුන අලය දිගටි හැඩයක් ගැනීමයි. එය මෝටාර් බෝම්බයක හැඩය ගන්නා නිසා මෙයට "මෝටාර්" යන නම යොදා ඇත්තේ ගොවීන් විසිනි. මෝටාර් බැසීම හා බැඳුනු විද්‍යාත්මක හේතුන් පැල්වෙහෙර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා විස්තර කළේ මෙසේ ය . "අපේ රටේ ගොවීන්ගේ ආර්ථිකයත්, දේශ ගුණික සාධකත් දිහා බැලූවිට ලංකාවට යෝග්‍ය වන්නේ මාස 3 - 31 / 2 වැනි කෙටි කාලයක් තුළ අස්වැන්න ලබා ගත හැකි ප්‍රභේදයන් . ඒ සඳහා බීජ මිලදී ගැනීමට ඉන්දියාවට යන වෙළඳුන් කෙටි වර්ධක කාලයකින් සමන්විත බීජ ප්‍රභේද ඇනවුම් කළත්, ඇතැම් විට ඒ සඳහා ඔවුනට

19 පිටුවට ⇨

රන්ගිරි දඹුල්ලේ සිට...
17 පිටුවෙන්

ලැබෙන්නේ කෙටි අව් ( short day ) ළූණු ප්‍රභේද වල බීජ වර්ගයි. ඒත් ලංකාවේ මේ ළූණු වගාව ආරම්භ කරන ජූනි මාසයේ දිවා කාලය රෑ කාලයට වඩා විනාඩි 33 ක් වැඩියි. ළූණු ආලෝකයට ඉතා සංවේදි ශාකයක්. මේ නිසා කෙටි අව් ප්‍රභේද, දිගු දිවා කාලයක් ඇති සමයක වගා කිරීමේ ප්‍රතිඵලය වශයෙන් "මෝටාර්" වගීයේ අල බැසීම සිදු වෙනවා."

ඉහත සදහන් කර ඇති පරිදි ගොවීන් බීජ මිළයට ගනු ලබන්නේ පෞද්ගලික වෙළඳුන් ගෙනි. පෞද්ගලික වෙළෙඳුන්ගේ බීජ මිලෙහි පරාසය මෙන්ම බීජ වල තත්ත්වය ද ඉතා වෙනස් වේ.



"ගොවියෙකු අයහපත් බීජ නිසා විඳිමට සිදු වූ ගැටළු විස්තර කරමින්......

බීජ අලෙවියේ දී වෙළෙඳුන් කොතෙකුත් කූට උපක්‍රම භාවිතා කරන අතර විශේෂයෙන් ම ජීව්‍ය හැකියාව නොමැති පරණ බීජ, අළුත් බීජ හා කලවම් කොට ගොවීනට අලෙවි කිරීම කරනු ලබයි. වරෙක ඉන්දියාවේ මුද්‍රිත මළුවල ලංකාවට ආනයනය කළ බීජ හොඳ තත්ත්වයේ තිබූ බැවින් ඒවා ගොවින්ගේ හිත් දිනා ගනු ලැබී ය. ඒ සඳහා හොඳ ඉල්ලුමක් පැවති නිසා, ඇතැම් ව්‍යාපාරිකයෝ හිස් මළු නැවත එකතු කර, ව්‍යාජ ඇට පුරවා අලෙවියට ඉදිරිපත් කළහ . ප්‍රදේශයේ එක්තරා බීජ වෙළෙන්දෙකු ඉන්දියාවෙන් හිස් මළු සහ මළු මැසීම සඳහා උපයෝගී කරගන්නා මැසිමක් ආනයනය කොට ව්‍යාජ බීජ අලෙවි කරණ බවද මේ පිළිබඳව කළ විමසීම් වලදී අපට දැන ගන්නට ලැබුණි .

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බීජ අලෙවිය සඳහා ඉදිරිපත් නො වන්නේ ඇයි දැයි විමසූ විට මෙවන් පිළිතුරක් ලැබුණි . "1991 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් ටින් කළ ළූණු බීජ අලෙවි කළා . ඒ අවුරුද්දෙ ඇති වූ මෝටාර් බැසීමට වඩාත් ගොදුරු වුයේ ඒ විදියට අලෙවි කළ බීජ වලින් ඇති වූ ළූණුයි". එම නිසා ගොවීන්, ගොවිජන සේවා මධ්‍යස්ථාන කෙරෙහි තැබූ විශ්වාසය පලුදු වී ඇතැයි ද ප්‍රකාශ විය. මේ ගැන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් ( බීජ සහ රෝපණ ද්‍රව්‍ය) අපි විමසුවෙමු. " එම සිදුවීම සත්‍යයක්. එක කාලෙක එම බීජ කෙලින්ම ඉන්දියාවෙන් ද, තවත් අවස්ථාවක නෙදර්ලන්ත සමාගමක් හරහා ඉන්දියාවෙන් ද ඇනවුම් කළා. හොඳ බීජ ගොවීනට ලබා දීම තුලින් , ශ්‍රී ලංකාව තුල තමන් සතු ළූණු වෙළෙඳ පොල අහිමි කර ගැනීමට ඉන්දියාව අකමැති නිසා, ඔවුන් හිතා මතාම අපට නොගැලපෙන අන්දමේ බීජ අලෙවි කළ බවට සැක කළ හැකියි".

ලොකු ළූණු යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන සියඹලාහේන ඥානසේන මහතා හමු වීමට ද මෙහිදී අපට අවස්ථාව උදා විය . ඔහු විසින් නිෂ්පාදිත "දඹුලු රෙඩ්" නම් ළූණු ප්‍රභේදය ගැන අපි විමසුවෙමු. 1989 දී "පූනා රෙඩ්" නම් ඉන්දියානු ළූණු ප්‍රභේදයේ ග්‍රෑම් 100 බැගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවීන් කිහිප දෙනෙක් අතර බෙදා දුන්නා.

ඉන් ලැබුන අස්වැන්නෙන් ළූණු බල්බ කිලෝ අටක් වසන්තීකරණය පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට භාර දුන්නා .

1990 ජනවාරි මාසයේ එම බල්බ වගා කිරීමෙන් පසුව බීජ ග්‍රෑම් 600 ක් ලබා ගන්න පුළුවන් වුනා . එම බීජ ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු කිරීමෙන් "දඹුලු රෙඩ්" නැමැති ප්‍රභේදය නිෂ්පාදනය කළා. මෙම බීජ වලින් ලැබෙන බල්බ හොඳ තත්ත්වයේ තිබෙනවා. මෙම බීජ සඳහා හොඳ ඉල්ලුමක් තියෙනවා. කඩේ රු 250 වත් බීජ මිලයට ගත හැකි වුවත් නිෂ්පාදනය කළ දඹුලු රෙඩ් ප්‍රභේදයේ බීජ කිලෝ ග්‍රෑමයක් 1992 වසරේ දී රු.1500 බැගිනුත්, 1993 දී රු. 1000 බැගිනුත් පහසුවෙන් අලෙවි කල හැකි වුනා. හොඳ බීජ තිබෙනවා නම් ගොවීන් ඒ සඳහා අවශ්‍ය තරම් මුදල් ගෙවන්න සූදානම්.

"දඹුලු ප්‍රදේශයට අවශ්‍ය තරම් බීජ නිෂ්පාදනය කිරීමට ඔහුට හැකියාවක් ඇත්දැයි විමසූ විට "බීජ නිෂ්පාදනයට අවතීර්ණ වීමට කැමැත්ත ඇති හොඳ ගොවීන් මේ ප්‍රදේශයේ ඉන්නවා බීජ නිෂ්පාදනය කිරීමට ගොස් තම ළූණු අස්වැන්න විනාශ වෙන්න පුළුවනි. එවන් පාඩුවක් ගොවි මහතෙකුට දරා ගැනීම අපහසු නිසා මේ සඳහා ආධාර කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ අදාල වෙනත් ආයතනයක් හෝ ඉදිරිපත් වීම වැදගත් . පහසුකම් ලබා දෙනවා නම් මේ කාර්යය පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකියි. අඩුම තරමෙන් ගොවි රක්ෂණයක් හෝ ලබාදීම ඉතා වැදගත් වෙනවා" යි ඥානසේන මහතා ප්‍රකාශ කළේ ය

හේ තව දුරටත් මෙසේ පැවසීය. "මා ලගදී ඉන්දියාවේ කළ සංචාරයකදී ඉන්දියාවේ ළූණු වගාව ගැන අධ්‍යයනය කළා . අස්වැන්න මාස හයක් කල් තබා ගත හැකි ළූණු ප්‍රභේද ඉන්දියාවේ තිබෙනවා . ඒ නිසා එවැනි ප්‍රභේද අප රටට ද හඳුන්වා දිය හැකි නම් , ළූණු කල් තබා ගැනීම තුලින් අස්වැන්න ආරක්ෂා කර ගත හැකිවා වගේම, අලෙවිකරණය වඩා දිගු කලක් පවත්වා ගෙන යාම තුලින් ගොවීන්ගේ ආර්ථිකය ද ශක්තිමත් කළ හැකියි."

"ළූණු බීජ නිෂ්පාදනය දිරි ගන්වන අතරම අවශ්‍ය ප්‍රමිතීන් ගෙන් සපිරි බීජ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමට කාලය එළඹිලා තියෙනවා" යි පැවසූ, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා මෙසේ ද ප්‍රකාශ කළේ ය. "බොහොමයක් බෝග වලට මෙන් ම ළූණු සඳහා ද බීජ පනතක් නො තිබීම, විශාල අඩුපාඩුවක් . ශ්‍රී ලංකාවට ගැලපෙන බීජ පනතක් සකසා එය නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමෙන් ද, ගොවීන් ළූණු බීජ නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම සහ ඔවුනට නිෂ්පාදනයේ දී මෙන්ම අලෙවියේ දී පහසුකම් සකසා දීම තුලින් ශ්‍රී ලංකාවේ දේශගුනයට ගැලපෙන ළූණු බීජ නිෂ්පාදනය කිරීමට හැකි වෙනවා කියා විශ්වාස කරනවා."

**මෙම අධ්‍යයනය සඳහා නන් අයුරින් සහය පළ කළ පැල්වෙහෙර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, කෘෂි නිලධාරී සහ කෘෂි උපදේශක මහතුනුත්, ප්‍රදේශවාසී ගොවි ජනතාවටත් ස්තූතිය පුද කරමු.**

**සකස් කළේ - ආචාර්ය ඩබ්. යූ. කේ. රාජපක්ෂ**